සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**08 ශ්‍රේණිය** | **වර්ෂ අවසාන පරීක්ෂණය - 2019** | **14 S I**

**කතෝලික ධර්මය - I** | **කාලය පැය දෙකයි**

**නම හා විභාග අංකය :**

සැලකිය යුතුයි :- ●වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ලූක් ශුභාරංචියේ සංකේතය වන්නේ,
(i) මිනිසා (ii) රාජාලියා (iii) ගවයා (iv) සිංහයා

02. ලූක්තුමාගේ ශුභාරංචියේ ජේසුස් වහන්සේගේ වංශාවලිය ආරම්භ කරන්නේ,
(i) ආබ්‍රහම්ගෙන්ය (ii) ආදම්ගෙන්ය (iii) දාවිත්ගෙන්ය (iv) ස්නාවක ජුවාම්ගෙන්ය

03. ජේසුස් වහන්සේ විජාතීන්ට එළිය දෙන ආලෝකය බව ප්‍රකාශ කරන ලද දිවැසිවරයා වනුයේ,
(i) සිමියොන් (ii) එලියා (iii) නාතාන් (iv) මීකා

04. ලූක් ශුභාරංචියේ දැක්වෙන පරිදි ජේසුස් වහන්සේගේ උපත පළමුවෙන්ම ප්‍රකාශ කරන ලද්දේ,
(i) රජවරුන්ට (ii) ශාස්ත්‍රවන්තයින්ට (iii) එඬේරුන්ට (iv) හේවායන්ට

05. "තියෝපිලස්" යන්නෙහි තේරුම වන්නේ,
(i) දෙවියන් වහන්සේගේ පුත්‍රයාය (ii) දෙවියන් වහන්සේගේ හස්තය ය
(iii) ජේසුස් වහන්සේගේ මිතුරාය (iv) දෙවියන් වහන්සේගේ මිතුරාය

06. දෙවියන් වහන්සේ ලෝක ගැලවුම්කරුවාණන් වූ ජේසුස් වහන්සේ මෙලොවට එවීමට ජාතියක් බිහි කිරීමට කැඳවනු ලැබුවේ,
(i) ජාකොබ් තුමාය (ii) ආබ්‍රහම් තුමාය (iii) දාවිත් රජතුමාය (iv) ස්නාවක ජුවාම් තුමාය

07. ස්නාවක ජොහාන් තුමා එදා සමාජයේ ජුදා නායකයන් දුටුවේ,
(i) බැටළුවන් ලෙස (ii) එළුවන් ලෙස (iii) පොළඟුන් ලෙස (iv) ඔටුවන් ලෙස

08. ජේසුස් වහන්සේ තමන් ඇති දැඩි වූ නාසරෙත් නුවර ධර්ම ශාලාවට වැඩම කර කියවන ලද ග්‍රන්ථය වන්නේ,
(i) යෙසායා (ii) ගීතාවලිය (iii) විරාවලිය (iv) දානියෙල්

09. දේව රාජ්‍යයේ පැමිණීමත් සමඟ ම සිදු වන්නා වූ අවසාන විනිශ්චය හේතු කොට ගෙන දමිටුවන්ගෙන් අදමිටුවන් වෙන් කොට ඔවුන්ට ලැබිය යුතු ඵල විපාක දෙනු ලබන බව පෙන්වා දෙන උපමාව වන්නේ,
(i) මුතු ඇටය පිළිබඳ උපමාව (ii) දැල පිළිබඳ උපමාව
(iii) නිධානය පිළිබඳ උපමාව (iv) වපුරන්නා පිළිබඳ උපමාව

10. "ස්ත්‍රිය, ඔබේ දුර්වලකමින් ඔබ මිදුණෙහිය'යි ජේසුස් වහන්සේ ප්‍රකාශ කරන ලද්දේ,
(i) මහලේ රෝගී කාන්තාවටය (ii) යායිරස්ගේ දියණියටය
(iii) කුදු ස්ත්‍රියටය (iv) පේදුරු තුමාගේ නැන්දම්මාටය

11. ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේ දී ස්ථාපිත කරන ලද දේව ප්‍රසාද නිධානය වන්නේ,
(i) ප්‍රසාද ස්තාපනය (ii) රෝගීන්ගේ ආලේපය (iii) අභිවෘද්ධි ආලේපය (iv) දිව්‍ය සත්ප්‍රසාදය

12. "ඔබ හමුයෙන් මා පලවා නොහැරිය මැනව. ඔබේ ශුද්ධාත්මය මා කෙරෙන් ඉවත් නොකළ මැනව" මෙලෙස සඳහන් වන්නේ,
(i) උත්පත්ති පොතේ (ii) ගණන් කථාවේ (iii) ගීතාවලිය පොතේ (iv) හිතෝපදේශය පොතේ

13. දෙවියන් වහන්සේට උතුම්ම ගෞරවය දීම හා උන්වහන්සේ අකැමැති දේ නොකිරීම ගැන කියවෙන ශුද්ධාත්ම දීමනාව වන්නේ,
(i) දේව භක්තිය (ii) ධෛර්යය (iii) දේව භය (iv) තේරුම් ගැනීම

14. අභිවෘද්ධි ආලේපය දේව ප්‍රසාද නිධානය දානය කිරීමේ බාහිර සලකුණ වන්නේ,
(i) නළල ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම (ii) ප්‍රසාද ස්තාපන පොරොන්දු අලුත් කිරීම
(iii) රදගුරු තුමා ශුද්ධාත්ම වරම් පතා යැදීමය (iv) විශ්වාසිකයින්ගේ යැදුම් උච්චාරණය කිරීමය

15. විශ්වය ශුද්ධවන්ත කිරීමේ කාර්ය හිමි වී ඇත්තේ,
(i) පියාණන් වහන්සේටය (ii) ශුද්ධාත්මයාණන් වහන්සේටය
(iii) පුත්‍රයාණන් වහන්සේටය (iv) අපෝස්තුළුවරුන්ටය

16. ඊශ්‍රායෙල් ජනතාව බබිලෝනියාවේ වහලුන් බවට පත් වූයේ,
(i) මිථ්‍යා ඇදහිලි අනුගමනය කළ නිසාය (ii) දෙවියන් වහන්සේට අකීකරු වූ නිසාය
(iii) සහෝදරයා සමඟ අමනාප වූ නිසාය (iv) දෙවියන් වහන්සේට විරුද්ධව බොරු කිවූ නිසාය

17. උත්ථාන වීමෙන් පසු ජේසුස් වහන්සේ දර්ශනය වූ පුද්ගලයෙකු වන්නේ,
(i) පේදුරු තුමා (ii) ස්තේපන් තුමා (iii) පිලිප් තුමා (iv) තෝමස් තුමා

18. ජන වන්දනාව පිළිබඳව අර්ථ දක්වමින් "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ" යන විශ්ව ලේඛනය ඉදිරිපත් කරන ලද ශුද්ධෝත්තම පියතුමා වන්නේ,
(i) I වන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා (ii) XII පියුස් ශුද්ධෝත්තම පියතුමා
(iii) XIII බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා (iv) II ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා

19. ශුද්ධ වූ සභාවේ නිල යැදුම ලෙසින් හඳුන්වනු ලබන්නේ,
(i) පඬුරු මත යැදුමය (ii) ස්තෝත්‍ර යාගික යැදුමය (iii) යාම යැදුමය (iv) බොදුනින් පසු යැදුමය

20. කිතුනු ජීවිතය හා බැඳී පවතින විශ්වාසයේ ක්‍රියාවලියක් වනුයේ,
(i) පදක්කම් පැළඳීම (ii) ආශිර්වාද කිරීම (iii) ශුද්ධ වූ ධාතු වලට ගරු කිරීම (iv) වන්දනා ගමන් යාම

(2 x 20 = 40)

## II - කොටස

- **ප්‍රශ්න 6 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. i. ලූක් ශුභාරංචියේ පරමාර්ථය කුමක් ද? ( ල . 2 )
ii. ලූක් තුමාගේ රැකියාවන් තුනක් ලියන්න. ( ල . 3 )
iii. ලූක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම් 5 ක් ලියන්න ( ල . 5 ) (2 + 3 + 5 = 10)

02. i. ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන ශුභාරංචි කතුවරුන් දෙදෙනා නම් කරන්න
ii.ශුභාරංචි ග්‍රන්ථ වල දැක්වෙන පාස්කු අභිරහස නම් කරන්න. ( ල . 3 )
iii.ස්නාවක ජුවාම් තුමා එදා සමාජයේ සිටි එක් එක් ජන කොට්ඨාසයන්ට දුන් පණිවිඩ ලියා එය ඔබේ ජීවිතයට අදාළ වන්නේ කෙසේදැයි කරුණු 2 කින් ලියන්න.( ල . 5 ) (2 + 3 + 5 = 10)

03. i.ජේසුස් වහන්සේ ජෝර්දාන් නදියේ බෞතිස්මය ලබන විට ඇසුණු හඬ ශබ්දය කුමක් ද? ( ල . 2 )
ii. ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා කතා තුන ලියන්න ( ල . 3 )
iii. ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යය වර්ග 4 ලියා ඉන් එක් ප්‍රාතිහාර්ය වර්ගයක් පිළිබඳ විස්තර කරන්න
(2 + 3 + 5 = 10)

04. i. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් වන ආකාර 2 ක ලියන්න. ( ල . 2 )
ii. දිව්‍ය පූජාවෙන් පරිබාහිරව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබිය හැකි අවස්ථා 3 ක් ලියන්න ( ල . 3 )
iii. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබූ ඔබ තුළ ඇති වන වෙනස්කම් 5 ක් ලියන්න ( ල . 5 ) (2 + 3 + 5 = 10)

05. i.අභිවෘද්ධිය ආලේපය දානය කිරීමේ දී රාජගුරු ප්‍රසාදීන් වහන්සේ ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීමෙන් පසු ඇතැම් විට සුළු කම්මුල් පහරක් දීමෙන් සංකේතවත් කරන අර්ථයන් 2 ක් ලියන්න. ( ල . 2 )
ii. පුරාණ ගිවිසුම තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ සඳහා භාවිතා කළ නම් 3 ක් ලියන්න. ( ල . 3 )
iii. අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් 5 ක් ලියන්න.(2+3+ 5= 10)

06. i. පුරාණ ගිවිසුම තුළ ප්‍රතිමා භාවිතා කළ අවස්ථා 2 ක් ලියන්න
ii. ඔබ දන්නා ශුද්ධවන්තයින් තිදෙනෙකු නම් කරන්න
iii. ඉරු දින ශුද්ධවන්තව ගත කිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් 5 ක් ලියන්න (2+3+ 5= 10)

07. i. ලාඕස් හා එර්ගොන් යන වචනයන්හි අර්ථය ලියන්න
ii. ජන වන්දනාවේ ප්‍රධාන අංග 3 ලියන්න
iii. දිව්‍ය පූජාවේ පිළිවෙත් 5 ලියන්න (2+3+ 5= 10)

08. පහත මාතෘකා 2 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (වචන 50 කට වැඩි විය යුතුය)
i. දේව ප්‍රසාද නිධාන ii. දෙවියන් වහන්සේට සමීප වීම iii. බාරහාර ඔප්පු කිරීම iv. ශුද්ධාත්ම ආගමනය

# තෙවන වාර පරීක්ෂණය - 2019
# කතෝලික ධර්මය
08 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

### I - කොටස

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 02. | 2 | 03. | 1 | 04. | 3 | 05. | 4 | 06. | 2 |
| 07. | 3 | 08. | 1 | 09. | 2 | 10. | 3 | 11. | 4 | 12. | 3 |
| 13. | 3 | 14. | 1 | 15. | 2 | 16. | 1 | 17. | 4 | 18. | 2 |
| 19. | 3 | 20. | 1 | | | | | | | | |

### II - කොටස

01. i. ජේසුස් වහන්සේ ජුදා ජනතාවගේ පමණක් නොව මුළු මිනිස් සංහතියේම ගැළවුම්කරුවාණන් බව පෙන්වා දීම

ii. ලේඛකයෙක්/ඉතිහාසඥයෙක්/චිත්‍ර ශිල්පියෙක්/වෛද්‍යවරයෙක්

iii යාච්ඤාවේ ශුභාරංචිය/අන්‍ය ජාතිකයන්ගේ ශුභාරංචිය/දයාවේ ශුභාරංචිය/ශුද්ධාත්මයාණන්ගේ ශුභාරංචිය/ කාන්තාවන්ගේ ශුභාරංචිය/දිළිඳුන්ගේ ශුභාරංචිය/කොන්වූවන්ගේ ශුභාරංචිය (2 + 3 + 5 = 10)

02. i. ශු. මතෙව් තුමා/ශු. ලූක් තුමා

ii. ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය, උත්ථානය

iii. සාමාන්‍ය ජනතාවට : අඳන දෙකක් ඇති අය නැති අයට දෙන්න
කෑම ඇති අය නැති අයට දෙන්න
අයකැමියන්ට : නියමිත පමණට වඩා අය බදු අය නොකරන්න
හේවායන්ට : බලහත්කාරයෙන්, බොරු චෝදනා නැගීමෙන් කිසිවක් පැහැර නොගන්න
අසරණ අයට පිහිට විය යුතු බව/අන්අයට හිරිහැර නොකළ යුතු බව/ලද දෙයින් සතුටු විය යුතු බව/ බෙදා හදා ගත යුතු බව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න (2 + 3 + 5 = 10)

03. i. "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි."

ii. යහපත් සමාරියා පිළිබඳ උපමාව / නැතිවුණු පුත්‍රයා පිළිබඳ උපමාව / ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාව

iii. ස්වභාව ධර්ම හා සම්බන්ධ ප්‍රාතිහාර්යය/රෝගීන් සුව කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්යය/දුෂ්ටාත්ම දුරු කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්යය/මළවුන් උත්ථානය පිළිබඳ ප්‍රාතිහාර්ය
පිළිතුරු ලියා ඇති ආකාරය බලා ලකුණු ලබා දෙන්න (2 + 3 + 5 = 10)

04. i. ආත්මික සූදානම/ශාරීරික සූදානම

ii. රෝගී වීම, වයස්ගත වීම, දිව්‍ය පූජාව පැවැත් වීමට පියතුමකු නොමැති වීම

iii. හිතේ සතුටක් ඇති වීම/අන් අය සමග සහයෝගයෙන් කටයුතු කිරීම / බෙදා හදා ගනිමින් ජීවත් වීම/ එදිනෙදා කටයුතු හරියාකාරව සිදු කිරීමට හැකි වීම/දෙවි පියාණන්ට ළං වීම වැනි කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න (2 + 3 + 5 = 10)

05. i. තමන්ට පැමිණෙන අභියෝග වලට මුහුණ දීම/ධර්මදූත කාර්යයට බැඳී සිටින බව

ii. ආත්මානුභාවය/දේවාත්මානුභාවය/ශුද්ධාත්මය

iii. ප්‍රසාද ස්තාපනය ලබා තිබීම/වයස අවු. 14 සම්පූර්ණ කර තිබීම/ඉෂ්ට වරප්‍රසාද ඇතිව සිටීම/ නිසි ධර්මෝපදේශයක් ලබා තිබිම/මෙම ප්‍රසාද නිධානය ලබා ගැනීමට ඇති ආශාව හා උනන්දුව(2 + 3 + 5 = 10)

06. i. කෙරුබ්වරු, ලෝකඩ සර්පයා

ii. ශු. අන්තෝනි තුමා, ශු. සෙබස්තියන් තුමා, ශු. මරිය ගොරෙන්ති තුමිය........ ආදී ශුද්ධවන්තයින් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

iii. දිව්‍ය පූජාවට සහභාගී වීම/දහම් පාසල් යාම/දයාවේ ක්‍රියාවල නිරත වීම/රෝගීන් බැහැ දැකීම/ශ්‍රමදාන වැනි පොදු කටයුතු වලට සහභාගී වීම/මීසමේ පවත්නා සමිති සමා ගම්වලට සහභාගී වීම
(2 + 3 + 5 = 10)

07. i. ලාඕස් - ජනතාව/එර්ගොන් - සේවය, වැඩකී
ii. දිව්‍ය පූජාව, දේව ප්‍රසාද නිධාන, යාම යැදුම
iii. ආරම්භක පිළිවෙත, දේව වාක්‍ය පිළිවෙත, පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත, ස්තෝත්‍ර යාගික පිළිවෙත/ ධර්මදූත කාර්ය සඳහා පිටත් කර යැවීමේ පිළිවෙත (2 + 3 + 5 = 10)

08. i. දේව ප්‍රසාද නිධාන
උත්ථානව වැඩ සිටින දෙවි සමිඳුන් සම්මුඛ වීම සඳහා ඇතුළතින් අප වෙත දානය කරනු ලබන දේව වරප්‍රසාද බාහිර වශයෙන් සලකුණු වන ආකාරයෙන් ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර ඇති සංඥා පිළිවෙත් දේව ප්‍රසාද නිධාන වේ.
- දේව ප්‍රසාද නිධාන 7 ක් බව. එම ප්‍රසාද නිධාන හත විස්තර කර ඇත්නම්.
- බාහිරව මෙන්ම ආධ්‍යාත්මිකව නිසි සූදානමකින් ලබා ගත යුතු බව
- වරප්‍රසාද රැසක් ලැබෙන බව

ii. දෙවියන් වහන්සේට සමීප වීම
- එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බව
- මිථ්‍යා ඇදහිලි වලින් වැලකී, අන් අයව ද ඉන් බේරා ගත යුතු බව
- දෙවියන් මත යැපෙමින් ජීවිත අභියෝග ජය ගත යුතු බව
- යක්ෂ, භූත, මායම් ඇති බව විශ්වාස නොකළ යුතු බව
- යාච්ඤාව, දිව්‍ය පූජාවට සහභාගී වීම, දේව වචනය කියවීම, මෙනෙහි කිරීම කළ යුතු බව

iii. බාරහාර ඔප්පු කිරීම
- බාරයන් යනු දෙවියන් වහන්සේට ප්‍රසන්න අමතර යමක් කරන්නට ස්වකීය කැමැත්තෙන් ම දෙන පොරොන්දුවකි.
- බාරය සිතා මතා විය යුතු බව
- බාර ඔප්පු කිරීමේ දී ආකල්ප වැදගත් බව
- බාරය කඩ කිරීම බරපතල වරදක් බව
- දෙවියන් වහන්සේ ලබා දුන් දෙයට හද පත්ලෙන් ම කළ ගුණ සැලකීමක්, ප්‍රීතිය පළ කිරීමක්, ප්‍රශංසා කිරීමක් විශ්වාසය ප්‍රකාශ කිරීමක් බව

iv. ශුද්ධාත්ම ආගමනය
- පෙන්තකොස්ත දින සිදු වූ බව
- සැඩ සුළඟක් හමනාක් වැනි හඬක් හදිසියෙන් අහසින් නික්මුණු බව
- ගිනි දළු වැනි දිවි බෙදී ගොස් එකිනෙකා මත පිහිටීම
- සියල්ලෝ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම
- අන්‍ය භාෂාවලින් කථා කිරීම
- මේ අවස්ථාවේ දී මරිය තුමිය ඇතුළු 120 ක් පමණ දෙනා සේනා කුළු ශාලාවේ සිටි බව
- ශුද්ධාත්ම ආගමනයෙන් පසුව නොබියව ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීම (5+5= 10)